# මගේ පූස් සුරතලී



චාතුර්යා තිසරණී පතිරණ

# මගේ පූස් සුරතලී

චාතුර්යා තිසරණී පතිරණ

# මගේ පූස් සුරතලී

© චාතුර්යා තිසරණී පතිරණ

කතෘ ප්‍රකාශනයකි

## කතෘගේ වෙනත් කෘති

* මගේ පුංචි රිචී

කෘතිය ප්‍රකාශයට පත් කරන දිනය - **2025.02.08**

**ISBN No: 978- 624-208-463-3**

# පිදුම

=====

මා හදා වඩා

නෙත් පෑදු

අම්මාටත්

තාත්තාටත්

මෙම පොත සකස් කිරීමට

උදවු කළ මාගේ

ගුරු මෑණිවරු හා පියවරුන්ටත්

අයියාටත්

අක්කාටත්

උපන් ගමටත්

බොහොමත්

ස්තූතියි .....!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකම එක දවසක අම්මයි, මමයි ගමනක් යන්න ලෑස්ති වෙලා ගමන යන්න පිටත් වුණා.



ටික දුරක් යද්දී පූස් පැටියෙක් අඬන සද්දේ ඇහෙන්න ගත්තා.

අපේ අම්මත්, මමත් බැලුවා ඇයි මේ පූස් පැටියා අඬන්නේ කියලා. අම්මයි, මමයි වටපිට බැලුවා. පාර අයිනේ පොඩි කාඩ්බෝඩ් පෙට්ටියක් දැක්කා.

අපි ඒ පෙට්ටිය ඇරලා බැලුවා.

අනේ දෙවියනේ !

"පුංචි ම පුංචි පූස් පැටියෙක්."



අම්මයි, මමයි ගොඩාක් දුක් වුණා.

"අම්මේ, පුංචි පූසි පැටියා පව් නේද?"

"ඔව් දුවේ, පුංචි පූසි පව්. මිනිස්සු කොච්චර නරක ද ගෙදර තියාගන්නේ නැතුව පාරට ගෙනත් දාලානේ."

අම්මයි, මමයි කතා වුණා. පුංචි පූසි පැටියා ගෙදර අරන් යමු කියලා. ඉතින් යන්න ගිය ගමනත් අමතක කරලා පූස් පැටියාත් අරන් ගෙදර ආවා.



ගෙදර යද්දී රිචිත් ඇවිත් පූස් පැටියාව ඉව කරන්න පටන් ගත්තා. අම්මා බය වෙලා රිචීට සැර කළා.

රිචීට දුක හිතිලා පුටුව යටට වෙලා දුකෙන් බලාගෙන හිටියා.



ඊට පස්සේ අම්මට දුක හිතිලා රිචීගේ ඔළුව අත ගාලා කිව්වා.

"රිචී, පූස් පැටියව හපන්න නම් එපා" කියලා.

රිචීට තේරුණා වගේ වලිගය වැනුවා.




අම්මා ඉක්මනින්ම කුස්සියට ගිහින් පූස් පැටියට කිරි හදලා දුන්නා.

චූටි පූස් පැටියා කිරි ටික සේරම බිව්වා.

අම්මා ඇහුවා පූස්ට කියන නම මොකක් ද කියලා. පූස් තැඹිලි පාටයි. රිචීගේ පාට වගේමයි. පූස් බබාට මිකී කියලා නම දැම්මා.



මට ගොඩාක් සතුටුයි. මම මගේ මිකීට ගොඩාක් ආදරෙයි.

තව ටික දවසකින් මම ඉස්කෝලේ යද්දී මිකීව ගෙදර තියලා යන්න වෙන නිසා මට ගොඩාක් දුකයි.



මම දුකෙන් හිටියට මිකී නම් රිචී එක්ක සෙල්ලම් කර කර සතුටින් ඉන්නවා දැක්කාම මට ගොඩාක් දුක හිතෙනවා.

*****

**අපිත් සතුන්ට හිරිහැර නොකර කරුණාව දක්වමු.**

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේ ම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන!

*ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,*

*සෙනෙවිරත්න මහලේකම්*